# EVENTS AFTER THE REPORTING PERIOD


***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of Sri Jayewardenepura***

# වාර්තාකරණ කාලච්ඡේදයට පසු සිද්ධීන්

මූල්‍ය ප්‍රකාශන සකස් කරන කාලච්ඡේදයේ අවසාන දිනයත්, මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට අනුමැතිය දෙන දිනයත් අතර කාලය තුළ සිදුවන සියලු වාසිදායක හා අවාසිදායක සිදුවීම්, වාර්තා කරන කාලච්ඡේදයට පසු සිද්ධීන් ලෙස හැඳින්වේ.




ClassWork.LK

# වාර්තාකරණ කාලච්ඡේදයට පසු සිදුවීම් වර්ග කිරීම

## ගළපන සිද්ධීන්

**වාර්තාකරණ කාලච්ඡේදයේ අවසාන දිනට පැවති තත්ත්වයට සාක්ෂි සපයන සිදුවීම්**

**මේවා මූල්‍ය ප්‍රකාශනවල ගැළපුම් කරයි**

### නිදසුන්

2022.03.31 දිනට සිටි ණයගැතියකු මූල්‍ය ප්‍රකාශන අනුමත කරන දිනයට පෙර (2022.08.10 දිනට පෙර බුන්වත් වීම නිසා 2022.03.31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ මෙය ගැළපුම් කළ යුතුයි.

- ☞ ගිණුම් කාලච්ඡේදය තුළ පැවරූ නඩුවක් සඳහා වාර්තාකරණ කාලච්ඡේදයෙන් පසු දුන් තීන්දුව මත ගෙවීමට සිදු වන වන්දියක්
- ☞ වාර්තාකරණ කාලච්ඡේදයේ අවසාන දිනට පැවති තොගයක පිරිවැය මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීමට පෙර අඩු අගයකට විකිණීම
- ☞ ගිණුම් කාලච්ඡේදය තුළ මිලට ගත් වත්කමක සත්‍ය වටිනාකම තීරණය වූයේ මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීමට පෙර දිනයක වීම

## නොගළපන සිද්ධීන්

**වාර්තාකරණ කාලච්ඡේදයෙන් පසුව පැන නැගුණ තත්ත්වයන් නිරූපණය කරන සිදුවීම්**

**මූල්‍ය ප්‍රකාශනවල ගැළපුම් නොකරයි**

### නිදසුන්

2022.05.10 දින තොගයෙන් කොටසක් ගිනි ගත්තේ නම්, එය 2022.03.31 දින පැවති තොගයට (තත්ත්වයට) බලපාන්නේ නැත. නමුත් අනුමත කිරීමට පෙර සිදු වී ඇති නිසා ප්‍රමාණාත්මක නම් 2022.03.31 දිනෙන් අවසන් වර්ෂයේ සටහනකින් පමණක් අනාවරණය කළ යුතු ය. මෙය ඊළඟ වර්ෂයට ගැළපුම් කළ යුතුයි.

- ☞ වාර්තාකරණ කාලච්ඡේදයෙන් පසු සාමාන්‍ය කොටස් හිමියන්ට ලාභාංශ ප්‍රකාශ කිරීම.
- ☞ වාර්තාකරණ කාලච්ඡේදයෙන් පසු මූල්‍ය ප්‍රකාශන අනුමත කරන අවසාන දිනයේ දී සමාගම සතු ආයෝජන වල වෙළෙඳපොළ අගය පහළ යෑම
- ☞ වාර්තාකරණ කාලච්ඡේදයෙන් පසු දිනක දී ව්‍යාපාරයේ ප්‍රධාන අංශයක් රජය විසින් පවරා ගැනීම

ClassWork.lk

# <u>ගළපන හා නොගළපන සිදුවීම් අතර වෙනස්කම්</u>

| ගළපන සිදුවීම් | නොගළපන සිදුවීම් |
|---|---|
| • වාර්තාකරණ කාලච්ඡේදයේ අවසාන දින පැවති තත්ත්වයට සාක්ෂි සපයයි. | • වාර්තාකරණ කාලච්ඡේදයෙන් පසු පැන නැගුණු තත්ත්වයක් නිරූපණය කරයි. පැවති තත්ත්වයට සාක්ෂි නොසපයයි. |
| • ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට බලපෑමක් සිදු කරයි. | • ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයට හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට බලපෑමක් ඇති නොකරයි. |
| • මූල්‍ය ප්‍රකාශන තුළ ගැළපුම් කළ යුතු ය. | • මූල්‍ය ප්‍රකාශන තුළ ගැළපුම් සිදු නොකරයි. |
| • ගැළපුම් සමග හෙළිදරව් කිරීම් ද අවශ්‍ය වේ. | • සටහනක් මගින් හෙළිදරව් කිරීමට සිදු වේ. |

ClassWork.LK

## අභ්‍යාසය - 01

ව්‍යාපාරයේ 2022.03.31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී පහත සිද්ධීන් ගළපන්නේද, සටහනක් තුලින් පමණක් අනාවරණය කරන්නේද, කිසිදු අණාවරණයක් සිදු නොකරන්නේ ද යන්න දක්වන්න.

### ගනුදෙනු ලැයිස්තුව

ගිණුම් කාලච්ඡේදය : 2021.04.01 - 2022.03.31

මූල්‍ය ප්‍රකාශ අනුමත කළ දිනය : 2022.08.15

1) සීමිත සුබෝධා පොදු සමාගමේ 2022.05.10 දින සාමාන්‍ය කොටස් සඳහා 10%ක ලාභාංශයක් ගෙවීමට යෝජනා කිරීම.

   ....................................................................

2) 2022.03.31 දින ආයෝජනයේ පිරිවැය රු.450000යි. 2022.08.15 දින මේවායේ වෙළෙඳපොළ අගය රු.350000ක් බව අධ්‍යක්ෂවරුන් විසින් ඇගැයීමට ලක් කර ඇත.

   ....................................................................

ClassWork.LK

3) සමාගමේ සේවකයකු සමාගමට විරුද්ධව පවරා ඇති නඩුවක් සඳහා 2022.04.15 දින රු.150 000ක වන්දි මුදලක් ගෙවන ලෙස තීන්දු කර ඇත.

..................................................................................

4) 2022.03.31 දිනට රු. 50 000ක් ලැබිය යුතු ණය හිමියකු මියගිය බව 2022.04.20 දින දැන ගන්නට ලැබීම

..................................................................................

5) 2022.07.12 දින සමාගමේ ප්‍රධාන කාර්යාලය තිබූ භූමිභාගය රජයට පවරා ගත් අතර, එහි වටිනාකම රු.1500 000ක් බව ඇස්තමේන්තු කර ඇත.

..................................................................................

6) 2022.03.31 දින තොගයේ පිරිවැය රු. 600 000කි. එහි ඇතුළත් රු. 100 000 ක් වූ තොගයක් 2022.04.10 දින රු. 75000 කට විකුණා ඇත.

..................................................................................

ClassWork.LK

7) 2022.07.10 දින ව්‍යාපාරයෙන් කොටසක් ගිනි ගැනීම නිසා සිදු වූ අලාභය රු. 500 000කට ඇස්තමේන්තු කර ඇත.

……………………………………………………………………

8) 2022.03.31 දිනෙන් අවසන් වර්ෂයේ දී තොග හානි සඳහා ඉල්ලා තිබූ රක්ෂණ වන්දිය සඳහා රු. 200000ක් ගෙවීමට රක්ෂණ සමාගම 2022.07.10 දින එකඟත්වය දක්වා ඇත.

……………………………………………………………………

## අභ්‍යාසය - 02

i. පහත පද නිර්වචනය කරන්න.

- වාර්තාකරණ කාලච්ඡේදය
- වාර්තාකරණ කාලච්ඡේදයට පසු කාලය
- වාර්තාකරණ කාලච්ඡේදයට පසු සිදුවීම්

ii. වාර්තාකරණ කාලච්ඡේදයට පසු සිදුවීම් වර්ග කරන්න.

iii. ගළපන සිදුවීම් හා නොගළපන සිදුවීම් වෙන් කර දක්වන්න.

ClassWork.LK

iv. ගලපන සිදුවීම් හා නොගලපන සිදුවීම් සඳහා නිදසුන් ඉදිරිපත් කරන්න.

v. ව්‍යාපාරයක සිදු වූ පහත දැක්වෙන සිදුවීම් කිහිපය අතුරින් ගලපන සිද්ධිය හඳුනා ගෙන, එය ගැළපුම් කරන්න.

- ගිණුම් කාලච්ඡේදය තුළ ඉල්ලූ රක්ෂණ වන්දියක් ගිණුම් කාලච්ඡේදයෙන් පසු රු. 10000ක් ගෙවන බවට රක්ෂණ සමාගම එකඟ වීම.

- ගිණුම් කාලච්ඡේදයෙන් පසු සාමාන්‍ය කොටස් හිමියන්ට රු.5 000ක ලාභාංශයක් ගෙවීමට යෝජනා කිරීම.

ClassWork.LK

## අභ්‍යාසය - 03

සීමිත පෙරේරා සමාගමේ ගිණුම් වර්ෂය 2022.03.11 දිනෙන් අවසන් වේ. 2022.05.30 දින සමාගමේ මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂවරුන් විසින් අනුමත කර ඇත. 2022.03.31 දිනට පසු අනාවරණය කරගත් තොරතුරු මෙසේය.

1) 2022.03.31 දිනට පැවති තොගයේ අඩංගු පිරිවැය රු. 350 000ක් වූ තොගයක් 2022.04.25 දින රු.250000 කට විකුණා ඇත. 2022.03.31 දිනට එම තොගයේ ඇස්තමේන්තුගත ශුද්ධ උපලබ්ධි අගය රු.290 000කි.

2) සමාගමේ සේවකයකු වූ සෝමපාල, සමාගමට විරුද්ධව නඩුවක් පවරා ඇත. එම නඩුවට අදාළව රු. 100 000ක වන්දියක් ගෙවිය යුතු බව 2022.04.15 දින උසාවිය විසින් තීන්දු කර ඇත.

ClassWork.LK

3) 2022.04.30 දින රු. 500000 ක් වූ ගොඩනැගිල්ලක් ගිනි ගෙන විනාශ වී ඇත. එයින් වූ අලාභය රු. 150000ක් බව ඇස්තමේන්තු කර ඇත.

4) සමාගම පාවිච්චි කළ රු. 1500 000ක් වටිනා ඉඩම 2022.05.07 දින රජය විසින් පවරා ගෙන ඇත.

**අවශ්‍ය වන්නේ :**

i. ගළපන සිදුවීම් නොගළපන සිදුවීම් වෙන් කර දැක්වීම

ii. මූල්‍ය ප්‍රකාශ තුළ ගළපන ආකාරය හා අනාවරණය කරන ආකාරය දැක්වීම

ClassWork.LK

## අභ්‍යාසය - 04

පහත සඳහන් ප්‍රකාශවල සත්‍ය අසත්‍ය බව දක්වන්න.

1) ගිණුම් කාලච්ඡේදයේ ආරම්භක දිනයත් අවසාන දිනයත් අතර කාලය වාර්තාකරණ කාලච්ඡේදයයි.

(.....................)

2) සාමාන්‍ය කොටස් හිමියන්ට ගිණුම් කාලච්ඡේදයෙන් පසු ලාභාංශ යෝජනා කිරීම අනාවරණය කිරීම පමණක් කළ යුතු ය.

(.....................)

3) ගිණුම් කාලච්ඡේදය අවසාන දිනයේ වූ රු. 100 000ක තොගයක් මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීමට පෙර දිනයක රු. 80 000කට විකුණා ඇත. මෙය ගැළපීම නිසා ලාභය වැඩි වීමක් සිදු වේ.

(.....................)

Class Work.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura